# COVID-19 වසංගතය යටතේ ජලය ආශ්‍රිත ආපදා අවදානම් අවම කිරීම සඳහා වූ මූලධර්ම

COVID-19 වසංගතය යටතේ නායකයන්, පාලනතීරකයන් (තීරණ ගන්නන්) සහ පුරවැසියන්ද රටවල සහ නගරවල දිගටම දැඩිව ආ සන්නයේ සිදුවීමට ඉඩ ඇති ජලය ආශ්‍රිත ව්‍යසනයන්[1] පිළිබඳව දැනුවත් විය යුතුය. වත්මන් වසංගත තත්ත්වය සඳහා විශේෂයෙන්ම නිර්මාණය කර ඇති ආපදා අවදානම් අවම කිරීමේ (Disaster Risk Reduction (DRR)) උපායමාර්ග සහ ක්‍රියාපිළිවෙත් මගින් ආපදා බලපෑමට ලක් වන ප්‍රදේශ අධි වසංගත කේන්ද්‍රස්ථාන ප්‍රදේශ බවට ලක්වීමෙන් ආරක්ෂා වනු ඇති අතර ආපදා විපත්තිවලින් ඉක්මනින් නැවත ප්‍රකෘති තත්වයට පත්වීම උදෙසා සහය වන්නේය. ආපදා අවදානම් අවම කිරීමේ සහ COVID -19 ට අදාල අනුකූලතා කටයුතුවල වලට සම්බන්ධවන දේශපාලන නායකත්වයට හා අදාල ක්ෂේත්‍රයේ කළමනාකරුවන්ටද අනිකුත් සියලුම පාර්ශවකරුවන්ටද ප්‍රායෝගික උපදෙස්, උපායමාර්ග සහ ක්‍රියාපිළිවෙත් සැකසීම සඳහා පහත සඳහන් මූලධර්ම ඉදිරිපත් කරනු ලබයි. මෙම මූලපිරීම් අනාගතයේදී ඕනෑම අවස්ථාවක සිදු විය හැකි ජලය ආශ්‍රිත ව්‍යසනයන්ට මෙන්ම වසංගත තත්වය යටතේ පවා ඒ සඳහා පිළියම් යෙදිය හැකි වේ. එම මූලධර්ම ජලය ආශ්‍රිත විපත් අවම කිරීම සඳහා පාදක කරගන්නා අතරම අනෙකුත් විවිද ආපදා වර්ග අවම කිරීම සඳහාද භාවිතා කල හැක.

වත්මන් COVID-19 පරිසරය තුළ, COVID-19 ආසාදන අවම කිරීම සහ රෝගාතුර වූවන්ට ප්‍රතිකාර කිරීම කෙරෙහි කඩිනම් අවධානය යොමු කර ඇත. කෙසේ වෙතත්, ජලය ආශ්‍රිත විපත්ති සහ තර්ජනයන් COVID-19 වසංගත ව්‍යාප්තියට පෙර මෙන් ඇතිවීමේ දැඩි අවදානමක් පවතී. ආපදා අවදානම් අවම කිරීමේ හදිසි ප්‍රතිචාර සහ COVID-19 සෞඛ්‍ය සත්කාර ප්‍රතිචාර අතර අභියෝග, ගැටලු සහ සංකූලතා නිසා සමහර රටවල සහ නගරවල ඍණාත්මක බලපෑම් ඉහල යා හැකිය.

ජලය ආශ්‍රිත ව්‍යසනවලින් බලපෑමට ලක් වූ ප්‍රදේශ නව COVID-19 කේන්ද්‍රස්ථාන හෝ රෝගී පොකුරු බවට පත්වීමෙන් ආරක්ෂා කිරීම සඳහා වර්තමාන වසංගතයෙන් ආරක්ෂා වීමේ පූර්ව ක්‍රියා සහ ආපදා අවදානම් අවම කිරීමේ අදාල ක්‍රියා ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ. පහත සඳහන් මූලධර්ම දේශපාලන නායකයින්ට, ආපදා අවදානම් අවම කිරීමේ සහ COVID-19 හි කළමනාකරුවන්ට සහ සියලුම පාර්ශවකරුවන් හට සමගාමී ව්‍යසනයන් හේතුවෙන් ඇතිවන විශාල බලපෑම් වළක්වා ගැනීමට සූදානම් වීම සහ ප්‍රතිචාර දැක්විය යුතු ආකාරය පිළිබඳව ප්‍රායෝගික උපදෙස් දෙනු ලබයි. ජලය ආශ්‍රිත ව්‍යසනයන් සඳහා විසඳුම් ඉදිරිපත් (ආමන්ත්‍රණය) කිරීම වෙනුවෙන් මෙම මූලධර්ම හඳුනාගෙන ඇති අතර අනෙක් ආපදා වර්ග සඳහාද මෙම මූලධර්ම භාවිතා කළ හැකිය.

1 මූලධර්මය: වසංගතය තුළ ආපදා අවදානම අවම කිරීම පිළිබඳ නායකයින්ගේ දැනුවත්භාවය වැඩි දියුණු කිරීම
2 මූලධර්මය: ආපදා සහ වසංගත අවදානම් කළමනාකරණය පිළිබඳ ඒකාබද්ධ ක්‍රියාමාර්ග ගැනීම
3 මූලධර්මය: ආපදාවලට පෙර, අතරතුරේදී සහ පසු පිරිසිදු ජලය, සනීපාරක්ෂාව සහ පිරිසිදු බව හා විෂබීජ වලින් ආරක්ෂාව තිරසාර ලෙස සැපයීම
4 මූලධර්මය: COVID-19 වසංගත තර්ජනයෙන් ආපදා අවදානම් කළමනාකරණ පාර්ශවකරුවන් ආරක්ෂා කිරීම
5 මූලධර්මය: හිඟ සහ දුර්ලභ බෙහෙත් අඳී වූ වෛද්‍ය සම්පත් ආපදා බලපෑමෙන් ආරක්ෂා කිරීම
6 මූලධර්මය: ආපදා වලින් මුදා ගන්නන් COVID-19 තර්ජනයෙන් ආරක්ෂා කිරීම.
7 මූලධර්මය: COVID-19 රෝගීන් ආපදා තර්ජනයෙන් ආරක්ෂා කිරීම.

---

1 මෙම ලේඛනයේ ඇති ජලය ආශ්‍රිත ව්‍යයසනයන් යන්නෙන් අදහස් කරන්නේ ජලය මගින් ඇතිවන බලපෑමට ලක්වන සියලු ආකාරයේ ව්‍යයසනයන්ය. ඒවාට අධික වැසි, කුණාටු, ගංවතුර, නියඟ, නායයෑම්, සුන්බුන් ගලායාම, සුනාමිය, උස් වඩදිය, ද්‍රවීකරණය, ග්ලැසියර විල් පිටාර ගැලීම, සහ ජල දූෂණ අනතුරු ඇතුලත්ය. ආපදාවලින් මිනිසුන් බලපෑමට ලක් වූ සංඛ්‍යාව අනුව සියලුම ආපදාවලින් 95% කට වඩා ජලය ආශ්‍රිත ආපදා වලින් මිනිසුන් බලපෑමට ලක්වී ඇත. පසුගිය ප්‍රධාන ව්‍යයසන 1000න් 90%කට වඩා ජලය ආශ්‍රිත ව්‍යයසන වේ.

8 මූලධර්මය: COVID-19 අගුලු දැමීම යටතේ ඇති නගර සහ ප්‍රදේශ සඳහා විශේෂිත වූ මුදා ගැනීම් මාර්ගෝපදේශයක් සැදීමට කටයුතු කිරීම
9 මූලධර්මය: COVID-19 යටතේ දැඩි ආර්ථික අර්බුද වළක්වා ගැනීම සඳහා ඵලදායී ලෙස ආපදා අවදානම අවම කිරීමේ ක්‍රියාමාර්ග මූල්‍යකරණය කිරීම
10 මූලධර්මය: අපගේ ලෝකය වඩා හොඳින් ගොඩනැගීම උදෙසා මෙම නිරන්තර සිදුවන ආපදා අවදානම අභියෝගවලට මුහුණ දීම සඳහා ගෝලීය සහයෝගීතාව සහ ජාත්‍යන්තර සහයෝගීතාව ශක්තිමත් කිරීම

*ආපදා ප්‍රතිචාර සහ ගංවතුර හෝ නියග ව්‍යසනයකින් නැවත ප්‍රකෘතිමත් වීම COVID-19 වසංගතය අවම කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමේදී සංකීරණ වන බැවින් මේ සඳහා,*

**1 මූලධර්මය: වසංගතය තුළ ආපදා අවදානම අවම කිරීම පිළිබඳ නායකයින්ගේ දැනුවත්භාවය වැඩි දියුණු කිරීම**

- COVID-19 වසංගතයට යටත්ව සිටින සියලු රටවල් සහ නගරවල ජලය ආශ්‍රිත ව්‍යසනයන් සිදුවීමට දැඩි ඉඩකඩක් ඇති බැවින් අවධානයෙන් සිටින්න. ආපදා සහ වසංගත යන දෙඅංශයෙන්ම බලපෑමට ලක් වූ ප්‍රදේශවල තත්ත්වයන් සංකීර්ණ සහ ව්‍යාකූල වියහැකි වුවද, පියවරෙන් පියවර තීරණ ගැනීම සහ අදාල ක්‍රියාමාර්ග ගැනීම ඉහත 1 වෙනි මූලධර්මය ක්‍රියාත්මක කිරීමට උපකාර වනු ඇත. එහිදී අදාල කාර්යයන් ඉතා විශාල හා සංකීර්ණ බවක් පෙනෙන්නට තිබුණත් එම අදාල කාර්යයන් අත්හැරීමෙන් වළකින්න. වසංගත තත්ත්වය ගැන සිතේ තබාගෙන අවබෝධයෙන් ආපදා අවදානම් අවම කිරීමේ තීරණ ගැනීම සහ අනෙක් අතට මෙම අදාල තීරණ ගැනීමෙන් පසුකාලීනව ගොඩනැගෙන ප්‍රශ්න සහ ව්‍යාකූලත්වයන් මගහරවා ගැනීමටද උපකාරීවනු ඇත.

- ආපදා සහ වසංගත අවදානම් කළමනාකරණ උපාය මාර්ග සහ ක්‍රියාමාර්ග ඒකාබද්ධ කිරීම් සහතික කරන්න. ආපදා අවදානම් අවම කිරීමේ සහ COVID-19 විශේෂඥයින්ගේ අඛණ්ඩව ඉදිරියට යන සංවාද සහ ඒකාබද්ධ උපදෙස් මත පදනම්ව උපදෙස් සැපයීම සඳහා ඒකාබද්ධ ආපදා අවදානම් අවම කිරීමේ සහ COVID-19 විශේෂඥයින්ගේ කණ්ඩායම් එක් කරන්න. එම අදාල එකාබද්ධ විශේෂඥයින්ගේ මතය හා නිර්දේශ විමසීමෙන් පසු අදාල තීරණාත්මක තීරණ ගන්න.

- ජලය ආශ්‍රිත ව්‍යසනයක් සිදුවුවහොත්, අත්‍යවශ්‍ය වෛද්‍ය සහ ආපදා අවදනම් අවම කිරීමේ පුද්ගලයින් ආරක්ෂා කිරීම ඇතුළුව රෝග පැතිරීම සහ සමගාමී විපත්වල සමුච්චිත බලපෑම් වැළැක්වීම සඳහා බලශක්තිය, ප්‍රවාහනය, ජලය සහ සනීපාරක්ෂාව වැනි මූලික සේවාවන් හැකි ඉක්මනින් නඩත්තු කිරීම හෝ යථා තත්ත්වයට පත් කිරීම. මේ සඳහා, තීරණාත්මක යටිතල පහසුකම්වල හදිසි ආරක්ෂණය සැලසුම් කිරීම සහ ප්‍රතිසාධන (නැවත ප්‍රකෘති තත්වයට පත්කිරීම) සඳහා ද්‍රව්‍ය /උපකරණ හදිසි සැපයුමක් සැකසීම වැනි පූර්ව ක්‍රියාමාර්ග ගන්නා ලෙස ආපදා අවදනම් අවම කිරීමේ කළමනාකරුවන්ගෙන් ඉල්ලා සිටින්න. නිලධාරීන් වැඩ මුරවල සිටින බැවින්ද COVID-19 යටතේ පොදු වැඩ අත්හිටුවා ඇති බැවින්ද ඒවා පහසුවෙන් ලබා ගත නොහැකි බැවින් හදිසි අවස්ථාවකදී ආපදා අවදනම් අවම කිරීමේ සඳහා පිරිස් සහ උපකරණ ඉක්මනින් බලමුලු ගැන්වීමට ක්‍රමයක් ස්ථාපිත කරන ලෙස ආපදා අවදනම් අවම කිරීමේ කළමනාකරුවන්ගෙන් ඉල්ලා සිටින්න.

- වහාම ක්‍රියාත්මක වන පරිදි වසංගත තත්ත්වය යටතේ ආපදා අවදානම් කළමනාකරණ සැලසුම් සකස් කරන ලෙස ආපදා අවදානම අවම කිරීමේ කළමනාකරුවන්ගෙන් ඉල්ලා සිටින්න.මෙහිදී රෝහල්, වෛද්‍ය පහසුකම් සහ එහි කාර්ය මණ්ඩලයේ ආරක්ෂාවට ප්‍රමුඛත්වය දිය යුතුය. ආපදා අවදානම අවම කිරීමේ සහ COVID-19 වැළැක්වීමේ ඉදිරි දර්ශනයට අදාල , COVID-19 යටතේ ආපදා අවදානම අවම කිරීමේ සැලසුම් තුළ, පිරිමින්, කාන්තාවන්, තරුණයින් සහ ළමුන්, වැඩිහිටියන්, ආබාධිත පුද්ගලයින්, සංක්‍රමණිකයන්,සරණාගතයින් සහ අභ්‍යන්තරව අවතැන් වූවන් වැනි අවතැන් වූ ජනගහන, පුරවැසිභාවය නොමැති පුද්ගලයින්, දිවා සේවකයන්, පැල්පත්වාසීන්, නිවාස නොමැති අය සහ නිදන්ගත රෝග ඇති අය වැනි COVID-19 ට පහසුවෙන් ගොදුරු විය හැකි පුද්ගලයින්, ආදී පුද්ගලයන්ගේ විශේෂිත අවශ්‍යතා සපුරාලිය යුතුය. ආපදා සහ COVID-19 මගින් බලපෑමට ලක් වූ පුද්ගලයන් සහ ස්ත්‍රී පුරුෂ භාවය, වයස, ජාතිය, නිදන්ගත රෝග සහිත/ රහිතව ආදී ඉහත සඳහන් කර ඇති විශේෂිත කණ්ඩායම් අනුව COVID-19 සහ ආපදා යන දෙකටම එරෙහිව සටන් කිරීම සඳහා

ඵලදායී ඒකාබද්ධ සැලසුම් ස්ථාපිත කළ හැකි පරිදි ව්‍යසනයන් පිළිබඳ දත්ත එකතු කරන්න. මෙමගින් COVID-19 සහ ආපදා යන දෙකටම එරෙහිව සටන් කිරීම සඳහා ඵලදායී ඒකාබද්ධ සැලසුම් ස්ථාපිත කළ හැකි වේ.

- සිවිල් ආරක්ෂක බලධාරීන්ට සහ හදිසි වෛද්‍ය සේවාවන්ට ඔවුන් දැනටමත් COVID-19 වසංගතය අඩු කිරීම සඳහා සක්‍රියව ප්‍රතිචාර දක්වා ඇති බැවින් ආපදා සහ COVID-19 යන තත්ත්වවලට සමගාමීව මුහුණ දීම සඳහා යාමේදී ඔවුන්ගේ දායකත්වය ඉක්මනින් එම ආපදා තත්ව වලට අදාල වගකීම් සමතුලිතව බෙදීයන ආකාරයට සුදුසු හදිසි මෙහෙයුම් සැලසුම් ඇති බව සහතික කර ගන්න.

- සනීපාරක්ෂාව, විශේෂයෙන්ම පිරිසිදුව අත් සේදීම, COVID-19 ව්‍යාප්තිය පාලනය කිරීමේ තීරණාත්මක අංගයක් වන බැවින් ආපදා වලදී සහ ඉන් පසුව තිරසාර ජල සැපයුම සහ සනීපාරක්ෂාව සඳහා මානව හා මූල්‍ය සම්පත් වෙන් කිරීමේදී ඉහළම ප්‍රමුඛතාවය ලබා දෙන්න.

- ජාතික සහ ප්‍රජා ආපදා අවදානම් අවම කිරීමේ සැලසුම්වලට මෙම ලේඛනයේ මූලධර්මවල කරුණු (අයිතම) ඇතුළත් කරන්න. පුද්ගලික අංශය ඇතුළු සියලුම ආපදා අවදානම් අවම කිරීමේ පාර්ශවකරුවන්ට සහ ඔවුන්ගේ ව්‍යාපාර අඛණ්ඩ සැලසුම්වලට මෙම මූලධර්මවල කරුණු ඇතුළත් කරන ලෙස ඉල්ලා සිටින්න.

*ආපදා අවදානම් අවම කිරීමේ සම්පත් සහ COVID-19 අවම කිරීමේ ක්‍රියාකාරීන් ඵලදායි සහ කාර්යක්ෂම ප්‍රතිචාරයක් සඳහා සම්බන්ධීකරණය කිරීමට අවශ්‍ය බැවින්*

**2 මූලධර්මය: ආපදා සහ වසංගත අවදානම් කළමනාකරණය පිළිබඳ ක්‍රියාමාර්ග ඒකාබද්ධ කරන්න**

- සෞඛ්‍යය අංශය ඒකාබද්ධ අවදානම් කළමනාකරණ පද්ධතියට සම්පූර්ණයෙන්ම ඇතුලත් කරන්න. COVID-19 යටතේ ආපදා අවදානම අවම කිරීමේ ක්‍රියාමාර්ග ශක්තිමත් කිරීම සහ පාලනය සඳහා සෙන්ඩායි ආකෘතියෙහි (Sendai Framework) මූලික ප්‍රවේශයන් සහ ආපදා අවදානම අවම කිරීම සඳහා වූ වෙනත් ජාත්‍යන්තර මාර්ගෝපදේශ වල ඇති අදාල මාර්ගෝපදේශ භාවිතා කරන්න. අවදානම් මත පදනම් වූ ප්‍රවේශයන්,පුළුල් විස්තර සහිත හදිසි කළමනාකරණයන්,සියලු අදාල උවදුරු සඳහා වූ ප්‍රවේශයන්, ජනතාව සහ ප්‍රජාව කේන්ද්‍ර කර ඇතුළත් කරගත් ප්‍රවේශයන්, බහු-ආංශික සහ බහුවිධ සහයෝගීතාවයන්, සම්පූර්ණ සෞඛ්‍ය පද්ධතිය මත පදනම් වූ ප්‍රවේශයන් සහ සදාචාරාත්මක සලකා බැලීම් සඳහා ආදී වූ මාර්ගෝපදේශ මේ සඳහා භාවිතාකල හැක. සියලු වර්ගවල උවදුරුවලට ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීම සඳහා ආපදා අවදානම අවම කිරීමේ සහයෝගීතාවය සහ ක්‍රියාකාරී මුල්කෙටුම්පත් ජීව විද්‍යාත්මක උවදුරු ඇතුළුව සමාලෝචනය කර සුදුසු පරිදි සකස් සකස් කිරීමට අවශ්‍යය.

- COVID-19 තත්ත්වයන් යටතේ ඇති වූ අධික වැසි, ගංවතුර, සුළි කුණාටු සහ චණ්ඩ මාරුත (ටොනාඩෝ) පිළිබඳ මෑත සිදුවීම් අද්දැකීම් කඩිනම්ව අදාල අංශ සමග හුවමාරු කරගෙන පාඩම් ඉගෙන ගන්න. මෙම පාඩම් බොහොමයක් මෙම මූලධර්මවලින් පිළිබිඹු වේ.

- COVID-19 තත්වයන් තුළ ඔබගේ විශේෂිත, සමාජීය, සංස්කෘතික, භූගෝලීය සහ ආර්ථික සැකසුම් පෙන්නුම් කරනු ලබන ආපදා අවදානම අවම කිරීමේ ප්‍රවේශයන් පිළිබඳ තත්ත්ව-විශේෂිත මාර්ගෝපදේශ සහ අදාල අන්තර්ජාල ජාල වැඩසටහන් (webinars) සකස් කරන්න. COVID-19 තත්ත්වය යටතේ ආපදා අවදානම අවම කිරීමේ කළමනාකරුවන් සහ පාර්ශවකරුවන් විසින් ජලය ආශ්‍රිත ආපදා කළමනාකරණ අභ්‍යාස පැවැත්වීම සම්බන්දයෙන්ද සලකා බලන්න.

- ආපදාවලට පෙර රෝහල් සහ සෞඛ්‍ය පහසුකම් සඳහා උපද්‍රව සිතියම් සහ ආපදා අවදානම අවම කිරීමේ උපදෙස් ලබා දෙන්න. ආපදා / COVID-19 බලපෑමට ලක් වූ ප්‍රදේශ සහ පහසුකම් පිළිබඳ පොදු වන සිතියම් සාදන්න. අවදානම් සහිත ප්‍රදේශවලට පැමිණීමෙන් වැළකී සිටීම මගින් ආසාදන හා විපත් යන අවදානම් උවදුරු දෙකෙහිම අවදානම අවම කර ගත හැක. උපද්‍රව සිතියම්වලට ආපදා සහ වසංගත යන ද්විත්ව බලපෑම් හේතුවෙන් ඇති වන අනාරක්ෂිත භාවය, ගෘහස්ථ මට්ටමින් ජල අනාරක්ෂිත භාවය ද ඇතුළත් විය යුතුය.

- COVID-19 ආසාදිතයින් සහ ඊට අදාල අයිතම ආ රක්ෂිතව ඉවත් කිරීමද ආසාදනය වීම වැලැක්වීමද යන දෙකටම අවශ්‍යතා සපුරාලන පරිදි පවතින පූර්ව අනතුරු ඇඟවීමේ සහ ඉවත් කිරීමේ පද්ධති සමාලෝචනය කර වැඩිදියුණු කරන්න. වසංගත සීමා කිරීම් සහ මාර්ගෝපදේශ සන්දර්භය තුළ ස්වභාවික ව්‍යසනයෙන් මුදාගැනීම් සහ අනෙකුත් ප්‍රතිචාර කාරණා සම්බන්ධ සංක්ෂිප්ත සහ පැහැදිලි වූ "මුල් අනතුරු ඇඟවීමේ" සන්නිවේදන පණිවිඩ ක්‍රමවේදය සංවර්ධනය කරන්න.

- ආපදා අවදානම අවම කිරීමේ සහ COVID-19 පිළිබඳ ඒකාබද්ධ අවදානම් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන්න. සෞඛ්‍ය වසංගත ඇතුළු අවදානම් වලට හේතුවන තත්වයන් සඳහා ආපදා ඔරොත්තු දීමේ හැකියාවේ වැඩි දියුණු කිරීමේ වටිනාකම පිළිබඳ දැනුවත්භාවය වර්ධනය කිරීම, ආපදා වැළැක්වීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමෙන් සහ ආපදාවලට ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීම පිලිබදව ඇති දැනුම වැඩි දියුණු කිරීම මගින් හොඳින් සූදානම් වීම. අධි අවදානම් කලාපවල සහසම්බන්ධ සිදුවන ආපදා පිළිබඳ අවදානම තක්සේරු කරන්න . සන්නිවේදනයද කරන්න.

- ආපදා කළමනාකරණ කණ්ඩායම් විසින් ආපදාවෙන් පසු ප්‍රතිවිපාක සහ ප්‍රතිචාර පිළිබඳ විනිවිදභාවයක් පවත්වා ගෙන යන බවට සහතික වියයුතු අතර, Covid-19 ගැටළු විසඳීමට ප්‍රයත්න දරන්න. මහජනතාවට සහ ආපදාවලින් විපතට පත් වූවන්ට වලංගු හා යාවත්කාලීන තොරතුරු ලබා ගත හැකි විය යුතුය. ආපදා කළමනාකරණ කණ්ඩායම අවශ්‍යතා (දත්ත මත පදනම්ව) ගැලපීමෙන් සහ විශේෂයෙන් රෝගයට එරෙහිව සටන් කිරීම සඳහා අරමුදල් රැස් කිරීම සඳහා (මහජනතාවගෙන්) උපකාර ලබාගැනීමෙන් සමාජ සහයෝගීතාවය උපයෝගී කර ගැනීමට පහසුකම් සපයන්නෙකු වන්න. අවශ්‍යතා සඳහා උපකාර ඉක්මනින් ලබාදීමට හැකි පරිදි සහයෝගිතා වේදිකාවක් සාදන්න.

- තරුණයින්ගේ හැසිරීම රෝගය පාලනය කිරීමේදී තීරණාත්මක අංගයක් වන බැවින් COVID-19 පැතිරීම පාලනය කිරීම සඳහා ඔවුන්ගේ සාමූහිකත්වය සහ සහයෝගීතාවය ඉල්ලා සිටීම සඳහා ආපදා අවදානම අවම කිරීම සඳහා දැනට පවතින තරුණ කණ්ඩායම් සක්‍රීය කරන්න. COVID-19 වසංගතය යටතේ ආපදා කළමනාකරණය, සහන සහ ප්‍රතිසාධන ක්‍රියාකාරකම් වලදී තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය (ICT), නවෝත්පාදන සහ තරුණ ප්‍රජාවගේ දේශීය සගයන් බලමුලු ගැන්වීම ආදී වූ තරුණ කණ්ඩායම් වල ඔවුන්ගේ විශේෂ හැකියාව භාවිතා කරමින් ඔවුන් සමඟ සහයෝගයෙන් කටයුතු කරන්න.

*COVID-19 වැළැක්වීමේදී සහ විපත්ති වලින් ඉක්මන් ප්‍රකෘතිමත් වීමේදී ජලය, සනීපාරක්ෂාව සහ පිරිසිදු බව හා විෂබීජ වලින් ආරක්ෂාව තීරණාත්මක අංගයක් වන බැවින්*

**3 මූලධර්මය: ආපදාවලට පෙර, අතරතුරේදී සහ පසු පිරිසිදු ජලය, සනීපාරක්ෂාව සහ පිරිසිදු බව හා විෂබීජ වලින් ආරක්ෂාව තිරසාර ලෙස සැපයීම**

- ස්වභාවික උපද්‍රවයන් බොහෝ විට ජලය ලබා ගැනීමේ බාධාවන්ට තුඩු දෙන අතර එය COVID-19 අවම කිරීමේ ප්‍රයත්නයන්ට බලපෑ හැකි බව හොඳින් මතක තබා ගන්න. දැඩි ජල හිඟයක් ඇති ප්‍රදේශවල, COVID-19 වෛරසය මිනිසාගෙන් මිනිසාට සම්ප්‍රේෂණය වීම වැළැක්වීම සඳහා අත් සේදීම, අපද්‍රව්‍ය කළමනාකරණය සහ වෙනත් භාවිතයන් ක්‍රියාත්මක කිරීමට එම ආපදා දැඩිව බලපෑ හැකිය. ජල හිඟය සනීපාරක්ෂක අර්බුද පාලනය කිරීමට දරන උත්සාහයට බාධාවක් විය හැකි බැවින් නියඟය නිසා ඇති වන අවදානම් පිළිබඳව විශේෂ අවධානයක් යොමු කළ යුතුය.

- ජල යටිතල පහසුකම්, විශේෂයෙන්ම ජල මූලාශ්‍ර ජල දූෂණයෙන් ආරක්ෂා කරන්න. ජලය සහසම්බන්ද සමාන්තර ආපදා සහ වසංගතවල උපද්‍රව වැළැක්වීම සඳහා ජල රැස්කිරීම් ඇතුළු අපවිත්‍ර නොවන විකල්ප ප්‍රභවයන් භාවිතා කිරීම සහ අපජලය නැවත භාවිතා කිරීම සලකා බලන්න.

- ජල සේවා සපයන්නන්ගේ ආපදා අවදානම අවම කිරීම් සැලසුම්වලට ස්වභාවික උපද්‍රවයන් පමණක් නොව වසංගතවල බලපෑම් ද ඇතුළත් විය යුතුය. වසංගත අදාල කාර්ය මණ්ඩලයට බලපානු ඇති අතර එමඟින් සේවා සැපයීමේ ගුණාත්මක භාවයට බලපානු ඇත. වෛද්‍ය මධ්‍යස්ථාන, ජලය/සනීපාරක්ෂක ප්‍රවේශ ස්ථාන සහ ආපදා වලිදී මුදාගැනීමේ පුද්ගලයින් වැනි විවිධ මාර්ග හරහා ක්‍රියාවලියේ සෑම අදියරකටම සනීපාරක්ෂක කටයුතු ප්‍රවර්ධනය ඇතුළත් කළ යුතුය.

- අවදානම් තත්වයන් වලක්වා ගැනීම සඳහා, විශේෂයෙන්ම ආපදා අවස්ථාවලදී වෛරසය ආසාදනය වූ ප්‍රජාවන්ගේ අපජලයේ ඇති COVID-19 අදාල අංශු හඳුනා ගැනීමට පර්යේෂණ සහ සමීක්ෂණ ක්‍රියාමාර්ග ප්‍රවර්ධනය කරන්න. අපජලය මත පදනම් වූ වසංගත රෝග විද්‍යාව වැනි නව ප්‍රවේශයන් ගවේෂණය කරන්න. ඒවා ජල හා මලාපවහන පද්ධතිවලින් COVID-19 පැතිරීමේ විභවය පුරෝකථනය කිරීමට ඵලදායී හා කඩිනම් ක්‍රම විය හැකිය.

- ජල උපයෝගිතා ආයතන වලින් එම ආයතන වල අඛණ්ඩ සැලසුම් තුළ ඩිජිටල් මෙවලම් සහ දුරස්ථ ස්වයංක්‍රීයකරණ/අධීක්ෂණ පද්ධතිවල කාර්යභාරය වැඩිදියුණු කරන ලෙස ඉල්ලා සිටින්න. අත්‍යවශ්‍ය ජලය සහ අපජල මෙහෙයුම් කණ්ඩායම්, පාලන මධ්‍යස්ථාන සහ රසායනාගාර කාර්ය මණ්ඩලය හැර අනෙකුත් සියලුම දෙනා COVID-19 යටතේ හැකි නම් දුරස්ථ ක්‍රම වේද භාවිතා කරමින් රාජකාරි කටයුතු කළ යුතුය. ක්ෂේත්‍රයේ සේවකයින් සඳහා අදාල නිරෝධායන කාලසටහන් චක්‍ර සලකා එම කණ්ඩායම්වලට වෙනස් වැඩ මුර පැවරිය යුතු අතර එම කාර්යය මණ්ඩලය සඳහා COVID-19 විශේෂිත පුද්ගලික ආරක්ෂණ උපකරණ (PPE) භාවිතා කිරීමට අදාල ප්‍රවේශය තිබිය යුතුය.

*පවතින වසංගතයක් යටතේ ගංවතුර සහ නියඟයට ප්‍රතිචාර දැක්වීමේදී සහ යථා තත්ත්වයට පත්වීමේදී ඉතාවැදගත් යටිතල පහසුකම් සහ මානව වත්කම් අවශ්‍ය වන බැවින්*

**4 මූලධර්මය: COVID-19 වසංගත තර්ජනයෙන් ආපදා අවදානම් කළමනාකරණ පාර්ශවකරුවන් ආරක්ෂා කිරීම**

- COVID-19 පිළිබඳව ආපදා අවදානම් අවම කිරීමේ පාර්ශවකරුවන්ගේ අදාල අධ්‍යාපනය සහ උපාය මාර්ගිකව ධාරිතාව ගොඩනගන්න. ආපදා කළමනාකරණ නිලධාරීන්ට සහ ස්වේච්ඡා සේවකයන්ට ආසාදනය වළක්වා ගන්නේ කෙසේද යන්න පිළිබඳ ප්‍රවේශ විය හැකි සංක්ෂිප්ත සහ පැහැදිලි මග පෙන්වීමක් ලබා දෙන්න. උදාහරණයක් ලෙස, උපදෙස් පත්‍රිකා, අන්තර්ජාල ජාලගත වැඩසටහන් (webinar) සැපයීම සහ තවත් මේ හා සම්බන්ද දේවල් භාවිතා කරන්න. අදාල අත්පොත්වල සහ දෛනික පිරික්සුම් ලැයිස්තුවේ ආපදා අවදානම් අවම කිරීම් ක්‍රියාකාරකම්වල සමාජ දුරස්ථ භාවයට අදාල උපදෙස්ද ඇතුළත් කරන්න.

- ස්වේච්ඡා සේවකයන් ඇතුළු ආපදා අවදානම් අවම කිරීමේ පාර්ශ්වකරුවන් ආපදාවලට සූදානම් කිරීම්/වැළක්වීමේ/ප්‍රතිසාධන ක්‍රියාකාරකම්වල යෙදෙන විට මුව ආවරණ වැනි සම්මත COVID-19 ප්‍රති ආරක්‍ෂාවකින් සමන්විත බවට සහතික කර ගන්න. හැකි නම් ඉහත සඳහන් කල ආරක්ෂක මුව ආවරණ මෙන්ම COVID-19 පුද්ගලික ආරක්ෂණ උපකරණ (PPE) අධික ලෙස බෝවන අවස්ථාවන්හිදී භාවිතා කිරීම සඳහා ගබඩා කරන්න. වෛද්‍ය නොවන අවශ්‍යතා සඳහා පුද්ගලික ආරක්ෂණ උපකරණ (PPE) වැනි උපකරණ සැපයීම වැඩිවන අවස්ථාවන්හිදී වසංගත කාලපරිච්ඡේදය තුළ ආපදා අවදානම අවම කිරීමේ පුද්ගලයින් සඳහා පුද්ගලික ආරක්ෂණ උපකරණ (PPE) ගබඩා කිරීම ඵලදායී වනු ඇත.

- අදාල කාර්යමණ්ඩල සහ ආපදා වලින් ඉවත් කළ අය සමඟ සම්බන්ධතා වලදී ඇතිවිය හැකි ආසාදන වැළැක්වීම සඳහා ආපදා කළමනාකරණ නිලධාරීන්ගේ දෛනික ස්වයං-වෛද්‍ය පරීක්ෂාවන් අවශ්‍ය වේ.

- ස්වේච්ඡා සේවකයන් ඇතුළු ආපදා අවදානම් අවම කිරීමේ පාර්ශවකරුවන්ගේ සංචාර හරහා ඉක්මන් ආපදා වැළැක්වීමේ/ප්‍රකෘතිමත් වීමේ අවශ්‍යතාවය සහ COVID-19 බලපෑමට ලක් වූ ප්‍රදේශ සහ අඩු බලපෑමට ලක් වූ ප්රදේශ අතර රෝග සම්ප්‍රේෂණය වීම වැළැක්වීම සඳහා අදාල අවශ්‍යතා සංතුලනය කරන්න.

- ආපදා වලට අදාල වගකිවයුතු නිලධාරීන්ගේ නිරෝධායනය ආපදා අධීක්ෂණ සම්පූර්ණ ක්‍රියාවලියට බලපාන බැවින් ආපදා පිළිබඳ අධීක්ෂණයේ සහ අනතුරු ඇඟවීමේ ගුණාත්මකභාවය දෛනිකව පරීක්ෂා කර පවත්වාගෙන යාමට වග බලා ගන්න.

**5 මූලධර්මය: හිඟ සහ දුර්ලභ බෙහෙත් අදී වූ වෛද්‍ය සම්පත් ආපදා බලපෑමෙන් ආරක්ෂා කිරීම**

- මුදාගන්නන් ස්ථානගත කිරීම සඳහා ස්ථාන ලෙස රෝහල් සහ වෛද්‍ය පහසුකම් සහිත ස්ථාන නම් කිරීමෙන් වළකින්න. උපද්‍රව ආපදා සිතියම් සහ ආපදා අවදානම් අවම කිරීමේ සැලසුම් වල මුදාගැනීමේ ස්ථාන (Evacuation Places) ලෙස නම් කර ඇති එම රෝහල් ගොඩනැගිලි සහ වෛද්‍ය පහසුකම් ස්ථාන එම සිතියම් වලින් හා සැලසුම් වලින් ඉවත් කරන්න.

- පහත සඳහන් මාර්ග උපයෝගී කරගනිමින් ආපදා බලපෑම් වලින් වෛද්‍ය කාර්ය මණ්ඩලය, පහසුකම් සහ උපකරණ ආරක්ෂා කිරීමට ප්‍රමුඛත්වය දෙන්න.
  - අත්‍යවශ්‍ය විදුලි උත්පාදන උපකරණ ජලය ආශ්‍රිත විපත්වලින් (ගංවතුර, ආදිය) ආරක්ෂිත ස්ථාන වලට ගෙන යාම සහ රෝහල්, සෞඛ්‍ය ස්ථාන සහ වෛද්‍ය පහසුකම් සඳහා සහායක අතිරේක බල ශක්ති සැපයුම් උපකරණ සැපයීම.
  - යෝග්‍ය ආපදා අවදානම අවම කිරීමේ උපදෙස් සන්නිවේදනය සහතික කිරීම සඳහා රෝහල්, සෞඛ්‍ය ස්ථාන සහ වෛද්‍ය පහසුකම් වෙත ආපදා කළමණාකරණ නිලධාරීන් කඩිනම්ව පිටත් කර හැරීම.
  - අත්‍යවශ්‍ය වෛද්‍ය උපකරණ සහ ද්‍රව්‍ය මූලික අදියරේදීම ඉහළ මහල වෙත ගෙන යාම.
  - ආසාදිත කලාප සැලකිල්ලට ගනිමින් රෝගීන් සහ වෛද්‍ය කාර්ය මණ්ඩලය සඳහා ආපදා අවස්ථාවලදී එයින් මුදවා ගැනීමේ (Evacuation) සැලසුම් සකස් කරන්න.
  - ආපදා හේතුවෙන් ජල සැපයුම සහ සනීපාරක්ෂක සේවා අඩාල වුවහොත් රෝහල්, සෞඛ්‍ය ස්ථාන සහ වෛද්‍ය පහසුකම් සඳහා ජලය, සනීපාරක්ෂාව සහ විශ්බීජවලින් තොර සෞඛ්‍ය සුරක්ෂිත භාවය සැපයීමට ප්‍රමුඛත්වය දීමට කටයුතු කරන්න.
  - පවතින හා වැඩිවන වසංගත අවදානම් වලට මුහුණදීමට අවශ්‍ය නව ඉඩකඩ පහසුකම් සඳහා ඇති අධික ඉල්ලුම සඳහා සෞඛ්‍ය පහසුකම් සැපයීමට ආරක්ෂිත ස්ථාන (භූමි) හඳුනා ගැනීම. මෙහිදී ගංවතුර අවදානම් ඇති තැනිතලා භූමි වැනි ආපදා අවදානම් ප්‍රදේශ වල අතිරේක කෙටි කාලීන COVID-19 රෝහල් ගොඩනැගීම වැළැක්වීම.
  - ආපදාවක් ආසන්නයට පෙර හෝ ආපදාව ප්‍රබල වීමට ප්‍රථම හදිසි කළමනාකරණය සඳහා වගකිව යුතු වෛද්‍ය කාර්ය මණ්ඩලය වෙත මූලික ආපදා අවදානම අවම කිරීමේ දැනුම ලබා දෙමින් අදාල මූලික දේවල් පුහුණු කිරීම.

*ස්වාභාවික උපද්‍රව සහ COVID-19 යන අවදානම් දෙකෙහි අවදානම් සංයෝජනය, ඉහළ ජීවිත හානිවලට හේතු විය හැකි බැවින්*

**6 මූලධර්මය: ආපදා වලින් මුදා ගන්නන් COVID-19 තර්ජනයෙන් ආරක්ෂා කිරීම**

- අනුවර්තනය කරන ලද නවාතැන් ඇතුළත් සමාජ දුරස්ථභාවය, සනීපාරක්ෂාව පහසු කිරීම සහ සුදුසු නේවාසික පහසුකම් (නවාතැන් සඳහා) ලබාදීමේ ක්‍රියාපටිපාටි සහතික කිරීම සඳහා අදාල ඉවත් කිරීමේ සැලසුම් කඩිනම්ව නැවත සකස්කිරීම හෝ සංශෝධනය කිරීම. පොකුරු ආසාදනය වැලැක්වීම සඳහා ආපදාවලින් මුදවා ගනුලබන පුද්ගලයන් රඳවනු ලබන ගොඩනැගිලිවල / අදාල පහසුකම්වල නිසි වාතාශ්‍රය සහතික කිරීම. COVID-19 ආසාදිතයින් සහ අශ්‍රිතයින් ආපදාවලින් මුදවා ගැනිමේදී සියලු දෙනාගේ ආරක්ෂාව සඳහා සමාජ දුරස්ථභාවය සහ ස්වයං-නිරෝධායන රෝගීන් සඳහා වෙනම අවකාශයන් වැනි විශේෂිත අවශ්‍යතා සපුරාලීම සඳහා අවශ්‍ය විය හැකි අමතර ගොඩනැගිලි සහ නවාතැන් සඳහා අවකාශයන් හඳුනා ගන්න. ඉතා මැනවින්, COVID-19 රෝගීන් සඳහා වෛද්‍ය පහසුකම් සහිත විශේෂිත නවාතැන් සහ ස්වයං නිරෝධායන රෝගීන් සඳහා වෙනම ගොඩනැගිලි / පහසුකම් / මුදවාගැනීමේ භූමි ප්‍රදේශ ස්ථාපිත කළ යුතුය.

- හැකි සෑම විටම සහ ඕනෑම තැනක ආපදා වලින් මුදා ගැනීමේදී (ඉවත් කිරීමේදී) ප්‍රමුඛතා ක්‍රම ලෙස සිරස් ලෙස ඉවත් කිරීමේ ක්‍රමවේදය ප්‍රවර්ධනය කරන්න. මෙයින් අදහස් කරන්නේ ආරක්ෂිත නම්, ඉවත් කරන්නන්ගේම හෝ අසල්වැසි ගොඩනැගිල්ලේ දෙවන හෝ ඉහළ මහලට ඉවත් කිරීමයි. අනතුරු වළක්වා ගැනීමටත්, ඉවත් කිරීමේදී ඇතිවන විපත් කළමනාකරණය කිරීමටත්, ඉවත් කිරීමේ නවාතැන් වල මිනිසුන් බහුල ලෙස අඩු කිරීමටත්, එමගින් නවාතැන් තුළ වෛරසය ආසාදනය වීමේ අවදානම අවම කිරීමටත් මෙය අවශ්‍ය වේ. පැතලි පහත් බිම් වැනි සිරස් අතට ඉවත් කිරීම කළ නොහැකි ප්‍රදේශවල, ඉවත් කරන්නන්ගේ තදබදය වළක්වා ගැනීම සඳහා ඉහළ ගොඩනැගිලි, නවාතැන් සහ අවකාශයන් වැඩි කිරීම සඳහා කලින් ඉවත් කිරීම පිළිබඳව ප්‍රාදේශීය ප්‍රජාව සමඟ සාකච්ඡා කරන්න.

- සංකීර්ණ උවදුරුවලින් සමාජ ඇතුළත් කිරීමේ ප්‍රවේශය සමගින්, වඩාත් අවදානමට ලක්විය හැකි අය සඳහා කල්තියා ඉවත් කිරීම (මුදා ගැනීම ) සහ රැකවරණය සඳහා හඳුනා ගැනීම සහ අදාල සැලසුම් සකස් කිරීම. උදා:, ජ්‍යෙෂ්ඨ, ආබාධිත, ගර්භනී කාන්තාවන් සහ රෝගීන්ගෙන් නිදන්ගත රෝග ඇති රෝගීන් සඳහා

- ඉවත් කරන්නන් (ආපදාවලට ලක්වී එයින් ඉවත් කරන්නන්) සඳහා ප්‍රමාණවත් තරම් පිරිසිදු ජලය, සබන්, සනීපාරක්ෂක භාණ්ඩ සහ සනීපාරක්ෂක තුවා ලබා දෙන්න.

- ඉවත් කරන්නාගේ උෂ්ණත්වය පරීක්ෂා කිරීම වැනි මූලික වෛද්‍ය පරීක්ෂණ සිදු කරන්න.

- ඉවත් කරන්නන් සහ ඔවුන් අතර කොවිඩ්-19 ආශ්‍රිත අතර යම් වෙනස්කම් සිදුකිරීම (අසමාන ලෙස සැලකීම) වැළැක්වීම. සාවද්‍ය තොරතුරු සහ ව්‍යාජ පුවත් භීතිකා තත්ත්වය යටතේ වේගයෙන් සහ පුළුල් ලෙස පැතිරීමට නැඹුරු වන බැවින් විපත් සහ COVID-19 හි තත්ත්වය සහ බලපෑම් පිළිබඳ නිවැරදි තොරතුරු විනිවිදභාවයෙන් යුතුව ප්‍රකාශ කිරීම සහ බෙදා හැරීම දිගටම කරගෙන යාමට අවශ්‍ය කටයුතු යොදන්න.

- ආපදාවලට පෙර ඉවත් කිරීමේ (සෞඛ්‍ය ආධාර කට්ටල) කට්ටල වලට මුහුණු ආවරණ , පිසදැමීම් ද්‍රවය, සබන්, තුවා සහ උෂ්ණත්වමාන ඇතුළත් කරන ලෙස පුරවැසියන්ට උපදෙස් දෙන්න.

- වසංගතය යටතේ ඇතැම් ද්‍රව්‍ය ඉක්මනින්ම අබලි හා විනාශ වන බැවින් (භාවිතයට ගත නොහැකි ලෙස අපවිත්‍ර වීම) එම ද්‍රව්‍ය පරිත්‍යාගයට වඩා මුදල් පරිත්‍යාග සඳහා වැඩි වශයෙන් ඉල්ලීම් කරන්න. මුදල් නෝට්ටු හා කාසි භාවිතය හරහා COVID-19 ආසාදනය වීමේ අවදානම ඉහල බැවින් එය අ වම කිරීම සඳහා ආපදා අවදානම් අවම කිරීම් වලට අදාල ගෙවීම් ගනුදෙනුවලදී සෑම අංශයකම මුදල් ගනුදෙනු විද්‍යුත් මුදල් හුවමාරු ලෙස ප්‍රවර්ධනය කරන්න.

**7 මූලධර්මය: COVID-19 රෝගීන් ආපදා තර්ජනයෙන් ආරක්ෂා කිරීම**

- ආපදා අවදානම් අවම කිරීමේ සහ COVID-19 සඳහා ඒකාබද්ධ ප්‍රමුඛත්වය ලබා දී ඇති බවට සහතික වන අතර එමගින් මිනිස් ජීවිතයට සෘජුවම අනතුරක් වන අවදානම් වළක්වා ගන්න.

- බෝවන රෝග පිළිබඳ වෛද්‍ය පාලන මූලධර්ම මත පදනම්ව COVID-19 අවම කිරීම් සඳහා එය අවබෝධ කර ගැනීම සහ එයට අදාල ඒකාබද්ධ ක්‍රියාමාර්ග ගැනීම. මෙම වෛද්‍ය මූලධර්මවලට ඇතුළත් වන්නේ: 1) ආසාදන වලට හේතුවන මුලාශ්‍ර ඉවත් කිරීම; 2) සම්ප්‍රේෂණ මාර්ග ඇහිරීම; 3) අවදානමට ලක්විය හැකි කණ්ඩායම් ආරක්ෂා කිරීම වේ.

- ස්වයංනිරෝධායන හෝ අදාල නම් කරන ලද සුදුසු පහසුකම් සහිත ස්ථාන වල සිටින COVID-19 රෝගීන් සඳහා ආරක්ෂණ සැලසුම් සාදන්න. මෙහිදී සන්නිවේදන මාධ්‍ය සහ පණිවිඩ, අදාල ඉවත් කිරීමේ සැලසුම් ආපදා ආරක්ෂිත නිරෝධායන පහසුකම් සහ අදාල ඉවත් කිරීමෙන් පසු වෛද්‍ය ආධාර යන සෞඛ්‍ය ආරක්ෂක ක්‍රම යොදාගත හැක.

**8 මූලධර්මය: COVID-19 අගුලු දැමීම යටතේ ඇති නගර සහ ප්‍රදේශ සඳහා විශේෂිත මුදා ගැනීම් මාර්ගෝපදේශයක් සැදීමට කටයුතු කිරීම**

- ඵලදායි ලෙස මුදාගැනීම (ඉවත් කිරීම) සහ ආපදාවලට එරෙහිව ආරක්ෂාව සහතික කිරීමට මෙන්ම භීතිකා ක්‍රියා වැළැක්වීම සඳහා අගුලු දමා ඇති ප්‍රදේශවලට විශේෂ පූර්ව අනතුරු ඇඟවීමක් කරන්න.

- අගුලු දැමීමේ තත්වයන් නිසා භීතිය සහ ආසාදනය පැතිරීම වැඩි දියුණු කිරීම වැළැක්වීම සඳහා අනිශ්චිත සිද්දිවලට අදාලවද හදිසි ඉවත් කිරීමේ සැලසුම් සාදන්න. එම විශේෂිත ප්‍රදේශවලට අදාල නිශ්චිත සීමාවන් ඉවත් කිරීම ඇතුළත් කාලරේඛා ආකෘතියක් මත පදනම් වූ ආපදා ප්‍රතිචාර සැලසුම් සලකා බැලිය යුතුය.

- අගුලු දැමීමේදී ආපදා වලදී ආරක්ෂිත ප්‍රදේශ සහ ආපදා වලදී මුදාගැනීමේදී යොදා ගන්නා මාර්ග (ඉවත් කිරීමේ මාර්ග) නම් කිරීමට පළාත් පාලන ආයතන සමඟ සම්බන්ධීකරණය සහතික කිරීම.

*COVID-19 යටතේ ආපදා නිසි ලෙස හැසිරවීමෙන් ගෝලීය වශයෙන් ඩොලර් ට්‍රිලියන ගනනක් ඉතිරි වනු ඇති බැවින්*

**9 මූලධර්මය: COVID-19 යටතේ දැඩි ආර්ථික අර්බුද වළක්වා ගැනීම සඳහා ඵලදායී ලෙස ආපදා අවදානම අවම කිරීම ක්‍රියාමාර්ග මූල්‍යකරණය කිරීම.**

- වසංගත මූල්‍ය අවශ්‍යතා සහ ඉල්ලීම් සඳහා සම්පූර්ණයෙන්ම අරමුදල් සපයන අතරම ආපදා සහ දේශගුණය ආශ්‍රිත අවදානම් වලට මුහුණදීම සඳහා සහ එහිදී හදිසි අවශ්‍යතා සඳහා භාවිතා කිරීමට අතිරේක අයවැයක් සහ අරමුදල් තබා ගැනීම්. වසංගත සහ ආපදා උපද්‍රවයන් සංයුක්තය ආපසු හැරවිය නොහැකි ආර්ථික ව්‍යසනයක් ඇති කළ හැකි බැවින් ඒ අනුව අදාල කටුයුතු සිදුකරන්න. වසංගත හා ආපදාවලට කඩිනම්ව ප්‍රතිචාර දැක්වීම සඳහා ඉක්මනින් අරමුදල් වෙත ප්‍රවේශ විය හැක වීම පිණිස අදාල ආයතන බැංකු සහ/හෝ රක්ෂණ සමාගම් සමඟ හදිසි මූල්‍ය ගිවිසුම් සකස් කරන්න.

- COVID-19 තත්ත්වය යටතේ ශීඝ්‍රයෙන් මතුවී එන සහ වෙනස් වන බහුවිධ අවදානම් වලට මුහුණ දීම සඳහා සැලසුම් සකස් කිරීමට සහ ඒවාට ප්‍රතිචාර දැක්වීමට ආපදා අවදානම් අවම කිරීමේ යාන්ත්‍රණයන්ට හැකි වන පරිදි නම්‍යශීලී අරමුදල් සැපයීම සහ බෙදා හැරීම සහතික කරන්න.

- ආපදා සහ වසංගත වලට මුහුණ දීම සඳහා අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය සඳහා මිල ගණන්, සැපයුම්කරුවන්, ප්‍රවේශ වේලාවන් සහ පිරිවිතරයන් පිළිබඳ දත්ත සමඟ ගෝලීය, ඩිජිටල් සහ දත්ත පදනම් කරගත් සැලැස්මක් සැකසීමට හැකිවන පරිදි ආපදා අවදානම් කළමනාකරණ හැකියාවන් යාවත්කාලීන කරන්න. උදාහරණයක් ලෙස, නිෂ්පාදන ධාරිතාව නොමැතිකම, දිගු හා තදබදය සහිත සැපයුම් දාම සහ තරඟකාරී ගැනුම්කරුවන්ගේ අභියෝගවලට මුහුණ දීමට සැලසුම් තබාගන්න.

- දුරකථන මත පදනම් වූ ඩිජිටල් මුදල් හා නෝට්ටු හෝ කාසි රහිත ගෙවීම් හරහා ආපදා අවදානම් අවම කිරීමේ ගනුදෙනු වලදී ඩිජිටල් ගෙවීම් යාන්ත්‍රණය දිරිමත් කරන්න. සමීප සම්බන්ධතා වලින් සිදුවන ආසාදනය හරහා COVID-19 පැතිරීම වැළැක්වීම සඳහා නැගෙනහිර අප්‍රිකාවේ ආපදා වින්දිතයින් සඳහා රතු කුරුස සංවිධානය විසින් දැන් බෙදා හරින ලද ඩිජිටල් මුදල් වැනි ක්‍රමවේදයක් සකස් කිරීමද ඉතාමත්ම ප්‍රයෝජන වේ.

*කොවිඩ්-19 ට සහ ආපදා වලට එරෙහි සටන ජයග්‍රහණය කිරීම සඳහා හුදකලා වීමට වඩා ගෝලීය සහයෝගීතාවය අත්‍යවශ්‍ය වන බැවින්*

**10 මූලධර්මය: අපගේ ලෝකය වඩා හොඳින් ගොඩනැගීම උදෙසා මෙම නිරන්තර සිදුවන ආපදා අවදානම අභියෝගවලට මුහුණ දීම සඳහා ගෝලීය සහයෝගීතාව සහ ජාත්‍යන්තර සහයෝගීතාව ශක්තිමත් කිරීම.**

- මහා ව්‍යසනයක් සිදු වූ විට බලපෑමට ලක් වූ රටේ පාලනයට සහ ආර්ථිකයට ගෝලීය විශ්වාසයක් ලබා දීම සඳහා නිතිපතා විනිවිදභාවයෙන් හා වගකිව යුතු ලෙස ආපදාව සහ එහි බලපෑම පිළිබඳ නිවැරදි හා කාලෝචිත තොරතුරු ජාත්‍යන්තර ප්‍රජාව සමඟ බෙදාගන්න.

- COVID-19 කාර්ය සාධක බලකායන් සමඟ ක්‍රියාකාරීව සම්බන්ධීකරණය කිරීමට සහ ඇතැම් ප්‍රදේශවල ජලය ආශ්‍රිත විය හැකි ආපදා පිළිබඳව ඔවුන්ව දැනුවත් කිරීම සඳහා හඳුනාගත හැකි දේශගුණය සහ කාලගුණය ආශ්‍රිත අවදානම් පිළිබඳ අනාවැකි ලබා දීමට ලොව පුරා සිටින ලෝක කාලගුණ විද්‍යා සංවිධානයේ සහ එක්සත් ජාතීන්ගේ ආපදා අවදානම් අවම කිරීම් පිළිබඳ සංවිධානයේ (UNDRR) සංවිධානයේ මැදිහත්වීම හරහා කාලගුණ/දේශගුණික නියෝජිතායතන වල සහය හා අදාල තොරතුරු ඉල්ලා සිටින්න.

- ජාත්‍යන්තර ආපදා අවදානම් අවම කිරීම් සහ මානුෂීය ආධාර පිරිස් සහ උපකරණ සඳහා පහසුකම් සැලසීමට අවශ්‍ය උවහොත් සූදානම් වන්න. ඇතුල්වීමේ සීමාකිරීම් කර ඇති අවස්ථාවන්හිදී, ජාත්‍යන්තර ආපදා අවදානම් අවම කිරීම් සහ මානුෂීය ආධාර කරන පුද්ගලයින්ට හා කාර්යමණ්ඩල වලට සහ උපකරණවලට බලපෑමට ලක් වූ රටවල් සහ ප්‍රදේශවලට ඇතුළු වීමට ස්ථාපිත සම්මත ක්‍රමවේද අවශ්‍ය විය හැකිය. වීසා නිකුත් කිරීම, නිරෝධායන නිෂ්කාශනය සහ රේගු නිෂ්කාශනය වැනි පහසුකම් සැලසීමේ විධිවිධාන සහ වසංගතය අතරතුර ආරක්ෂිත සහය සඳහා සම්මත ක්‍රමවේද රටවල් විසින් පූර්ව සලකා බලා සැලසුම් කළ යුතුය. පිටත් කර හරින ලද කණ්ඩායම් සෞඛ්‍ය ආරක්ෂිත ඇඳුම් හා උපකරණ කට්ටලවලින් සමන්විත විය යුතුය. COVID-19 බලපෑමට ලක් වූ ප්‍රදේශවලට ඇතුළු වීමට පෙර එවැනි ජාත්‍යන්තර ආධාර කණ්ඩායම් වෙත අවශ්‍ය වෛද්‍ය උපදෙස් හා මාර්ගෝපදේශ ල බා දිය යුතුය. ජාත්‍යන්තර රතු කුරුස සහ රතු ක්‍රෙසන්ට් සමිති (IFRC) විසින් සම්පාදිත "ජාත්‍යන්තර ආපදා සහන සහ මූලික ප්‍රතිසාධන ආධාර (IDRL මාර්ගෝපදේශ)" දේශීය පහසුකම් සැපයීම සහ නියාමනය කිරීම සඳහා වන මාර්ගෝපදේශ සඳහා භාවිතයට ප්‍රවර්ධනය කළ යුතුය.

- ආපදා අවදානම් අවම කිරීම් හි උදාහරණ අනුගමනය කරමින් වසංගත ප්‍රතිපත්ති සහ රෙගුලාසි වල නිශ්චිත කලාපීය ආයතන පිහිටුවීම ගැන සාකච්ඡා කරන්න. නිදසුනක් වශයෙන්, ආසියාන් (ASEAN) රටවල්, කලාපීය මධ්‍යස්ථානයක් පිහිටුවීම මගින් මෙම දේශසීමා ගැටලුව සහ ආපදා අවදානම් අවම කිරීම් සඳහා කලාපීය/ජාත්‍යන්තර සහයෝගීතාවය ආමන්ත්‍රණය කර ඇත. දේශසීමා නැවත විවෘත කිරීම සහ අත්‍යාවශ්‍ය භාණ්ඩ වෙළඳාම ප්‍රවර්ධනය කිරීම සහ වේගයෙන් වෙනස් වන තත්වන් යටතේ ඔරොත්තු දෙන ආකාරයෙන් ජනයා ප්‍රවර්ධනය කිරීමේදී එවැනි යාන්ත්‍රණයක් පැවතීම ඉතා වැදගත් වේ.

- විපත්ති සහ වෙනත් හදිසි අවස්ථා හේතුවෙන් සංක්‍රමණය වන පුද්ගලයින් සහ සරණාගතයින් සඳහා COVID-19 නිසා ඇතුළුවීම තහනම් කිරීම වෙනුවට විශේෂ විධිවිධාන (නියෝග හා ක්‍රමවේද) ස හ රැකවරණය සලකා බැලිය යුතුය.

- ස්වභාවික උපද්‍රවයන් ඇතිවීම සඳහා දේශසීමා හෝ දේශපාලන අදාල නොවන බැවින් අදාල විවිධ දෘෂ්ටිකෝණවලින්, දේශසීමා මාර්ග වලින් තොර මෙන්ම අන්‍යෝන්‍ය එකතුවෙන් වැඩ කිරීම මගින් අදාල අවදානම් සිතියම් ගතකරන්න. ජලය, සනීපාරක්ෂාව සහ පිරිසිදු විෂබීජවලින් තොර ආරක්ෂාව, බලශක්ති, අධ්‍යාපනය, සෞඛ්‍ය හා පෝෂණය,ජීවනෝපායන්, ළමා හා සමාජ ආරක්ෂණය. නවාතැන් සහ නිවාස සහ පොදු විවෘත අවකාශයන් වැනි විවිද අංශ හරහා අදාල විසඳුම් ගවේෂණය කරන්න.

- සෑම කෙනෙකුම තම රටේ පුරවැසියන්ගේ ආරක්ෂාව සහ යහපැවැත්ම සඳහා ප්‍රථමයෙන් සහ ප්‍රධාන වශයෙන් සහභාගී විය යුතු බව හඳුනා ගනිමින් වසංගතය වැඩිවීමත් සමඟ එයට සාර්ථකව මුහුණදීම සඳහා අරගල කරන අඩු සහ මධ්‍යම ආදායම් ලබන රටවලට ජාත්‍යන්තර සහයෝගය ලබා දෙන්න. "අපේ කෙනාට තර්ජනයක් නම්

එය අපි හැමෝටම තර්ජනයක්" බව හැමවිටම මතක තබාගෙන කටුයුතු කරන්න. COVID-19 සහ ව්‍යසනයන් වලට මුහුණ දීමේදී අප ශක්තිමත්ම දුර්වලයන් තරම් පමණක් බව මතක තබා ගන්න.

- අවදානම අවබෝධ කර ගැනීමට සහ අඩු කිරීමට අදාල දේශසීමා හරහා සහ රජයන් තුළ මනා සම්බන්ධීකරණ ප්‍රවේශයක් ගන්න. ජාතික ආපදා අවදානම් කළමනාකරණ නියෝජිතායතන ඇතුළුව අදාළ සියලුම අමාත්‍යාංශවල හැකියාවන් උපයෝගී කර ගන්නා සමස්ත රාජ්‍ය ප්‍රවේශයක අවශ්‍යතාවය COVID-19 විසින් පෙන්නුම් කර ඇත.

- අපගේ ලෝකය නැවත වඩා හොඳින් ගොඩනැගීමට දැන් ප්‍රතිසාධන(ප්‍රතිස්ථාපන) සැලසුම් ආරම්භ කරන්න. ජාතික සහ ප්‍රාදේශීය ආණ්ඩු ඔවුන්ගේ ජාතික සහ ප්‍රාදේශීය ආපදා අවදානම් අවම කිරීමේ උපාය මාර්ග තුළ ජීව විද්‍යාත්මක උපද්‍රව සහ අවදානම් කෙරෙහි කළමණාකාරීව අදාල සාදක විය යුතුය (සෙන්ඩායි රාමුව ඉලක්ක (e))/ (Sendai Framework Target (e)). මෙම ව්‍යයසන විසින් ඉදිරිපත් කරන ලද අභියෝග අනාගත උපද්‍රවයන් හමුවේ රාජ්‍ය සහ පෞද්ගලික පද්ධති ඔරොත්තු දෙන බව සහතික කිරීම සඳහා නව සැලසුම් සහ සැලසුම් සඳහා පදනම සකසනු ඇත.